# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1977/2 - 2016 ජූලි මස 25 වැනි සඳුදා - 2016.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : මහ/ඉ/අත්/UDA/351.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 498A මාකුඹුර උතුර ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක කො 9634හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8207ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම:-

1. කැබලි අංක 1

ඉඩමේ නම: මහකුඹුර වෙල්යාය; ඉඩම් පරිහරණය: අත්හරිනලද කුඹුර හා ඕවිට අවුරුදු 15-20ක් පමණ වන පොල් ගස් 13ක් ඇත; හිමිකම් කියන අය: පන්නිපිටිය, මාකුඹුර පදිංචි යසපාල ඇල්විටිගල සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.4180.

2. කැබලි අංක 2

ඉඩමේ නම: මහකුඹුර වෙල්යාය; ඉඩම් පරිහරණය: අත්හරින ලද කුඹුර; හිමිකම් කියන අය: පන්නිපිටිය, මාකුඹුර පදිංචි හෙන්ද්‍රික් සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.2960.

3. කැබලි අංක 3

ඉඩමේ නම: මහකුඹුර වෙල්යාය; ඉඩම් පරිහරණය: අත්හරින ලද කුඹුර, අවුරුදු 15-20ක් වයසැති පොල් ගස් 5ක් හා ළිඳක් ඇත; හිමිකම් කියන අය: පන්නිපිටිය, මාලපල්ල 185/ඒ ලිපිනයෙහි පදිංචි කලුතන්ත්‍රිගේ ඉන්ද්‍රවතී පීරිස්; ප්‍රමාණය: හෙක්. 0.0942.

4. කැබලි අංක 4

ඉඩමේ නම: —; ඉඩම් පරිහරණය: පාර; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0125.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 9.00 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 ජූලි මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ

හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ ඒවායේ උධෘත සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණයේ දී, ඉදිරිපත් කළ යුතුය.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2016 ජුලි මස 20 වැනි දින,
මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 157

---

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රාදේශීය ලේකම් යොමු අංකය* : 6/3/7/15/11/7/35.
*ඉඩම් අමාත්‍යාංශයේ අංක* : LD/05/2007/MV/117C.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ 1904/33 හා 2015.03.04 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පිටු අංක 6A හි අංක 101 යටතේ පළ වූ හු. මු. පි. 18 අතුරු පිඹුරු අංක 64, පත්‍ර 47 දරන සැලැස්මට අයත් කැබලි අංක 2492 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.2967ක් ලෙස සඳහන් වුවද එය හෙක්ටයාර් 0.2697 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ආර්. බී. එන්. බී. කරුණාතිලක
ප්‍රාදේශීය ලේකම් ,
නාඋල.

2016 ජුලි මස 13 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී .

08 - 158

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : බගම/ප්‍රාලේ/2/2/575.

ඉහත ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1301/18 හා 2003.08.15 දිනැති *ගැසට් පත්‍රයේ* (අතිවිශෙෂ) බද්දේගම ප්‍රාදේශීය ලේකම් විසින් පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ වූ දැන්වීමෙහි අංක ගා. 3283 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 18 සම්බන්ධයෙන් අදාළ දිනයන් පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දන්වමි.

**සංශෝධනය**

ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ. ව. 10.30ට බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 සැප්තැම්බර් මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩී. කේ. එස්. ජයලක්ෂ්මී,
ප්‍රාදේශීය ලේකම්,
බද්දේගම.

2016 ජුලි මස 14 වැනි දින,
බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 159

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.